# 10 ශ්‍රේණිය

# ගෘහ ආර්ථික විද්‍යාව

කාර්යය පත්‍රිකාව.




නිපුණතාව 10

ගෘහීය අවශ්‍යතා සඳහා නිර්මාණ සකස් කිරීමේ දී විවිධ මැහුම් ක්‍රම යොදා ගනියි.

නිපුණතාව 11

පුද්ගල අවශ්‍යතා සඳහා රෙදි වර්ග හඳුනාගෙන ඇඳුම් නිර්මාණය කරයි.

එම්.ඒ.රේණුකා පී. පෙරේරා මිය. විශ්‍රාමික ගුරු උපදේශක

කලාප අධ්‍යාපන කාර්යාලය. මිනුවන්ගොඩ.

# කාර්යය පත්‍රිකාව

1. **A** ළදරු ඇඳුම් සඳහා සුදුසු රෙදි වර්ග

**B** ළදරු ඇඳුමක තිබිය යුතු ලක්ෂණ




**C** ළදරු ඇඳුම මැසීමේ අනුපිළිවෙල

2.

මැහුම් ක්‍රම වර්ගීකරණය
කරනු ලබන ප්‍රධාන
කොටස් තුන



3.

| A | B |
| --- | --- |
| මූලික මැහුම් ක්‍රම | විසිතුරු මැහුම් ක්‍රම |

---------------------------- -------------------------- ----------------------- ---------------------

----------------------------- --------------------------- ---------------------- ----------------------

4. බෝතල් ආවරණය අලංකාර කිරීම සඳහා හුරුළුකටු මැස්ම හා නැටි මැස්ම මැසීමට සුදුසු මෝස්තරයක් ඇඳ  දක්වන්න .

5 .පයිපිං  කිරීම සඳහා රෙදි කොටස් හතරක් මූට්ටු කරන ලද විකර්ණාකාර පටියක හොඳපිට ඇඳ දක්වන්න.

6.

වාටියක් මැසීමට යොදා ගත හැකි ක්‍රම තුනක්

-----------------------------

-----------------------------

-----------------------------

7. මැහුම් කලාව හැදෑරීමේ දී අනුගමනය කළ යුතු ,

| **A** යහපත් වැඩ පුරුදු | **B** ආරක්ෂක පූර්වෝපා |
|---|---|
| --------------------------------- | ------------------------------------- |
| --------------------------------- | ------------------------------------- |

8. රෙදි පිරියම් කිරීමේ ක්‍රම.

-----------------------------------------------------------

-----------------------------------------------------------

-----------------------------------------------------------

9. අක් සැරසිලි යනු,

------------------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------------------

10. ළදරු ඇඳුම් පන්න දෙකක් දළ රූප සටහනකින් දක්වන්න.

# පිළිතුරු පත්‍රය

1 A රෙදි වර්ග - මල් රෙදි, නෙන්සුක් , ලෝන් , වොයිල් , බැන්ඩේජ් රෙදි .

B ලක්ෂණ -

- ඇඳුම් ලිහිල් වීම.
- සරල පන්නයකින් යුතු වීම.
- ඇඟලෑමට හා පියවීමට පහසුවීම.
- මුට්ටු අවම වීම .
- මුට්ටු සඳහා පැතලි මූට්ටුව යෙදීම.
- විවර පියවීමට ටේප් ඇල්ලීම.
- අලංකාර කිරීමට සරල විසිතුරු මැහුම් ක්‍රම යෙදීම.

C මැසීමේ අනුපිළිවෙල -

- උරහිස මසන්න- පැතලි මූට්ටුව යොදන්න.
- සිහින් වාටියක් නවා වාටි මැස්මෙන්,
  - විවරය
  - කර
  - අත්කට
  - වාටිය මසන්න
- අත්කටෙහි කිහිලි නැම්ම ශක්තිමත් කරන්න- බ්ලැන්කට් මැස්ම යොදන්න.
- විවරය පියවීමට ළඳරු ටේප් අල්ලන්න.

2

- මූලික මැහුම් ක්‍රම
- විසිතුරු මැහුම් ක්‍රම
- මැසීමේ ශිල්පීය ක්‍රම

3 A – මූලික මැහුම් ක්‍රම -

- නූල් ඇදීම
- සිහින් නූල් දුවවීම
- වාටි මැස්ම - වාටි මැස්ම
  - සැඟි වාටි මැස්ම
  - සන්නාලි වාටි මැස්ම
- පිස්මේන්තු මැස්ම

B - විසිතුරු මැහුම් ක්‍රම -

- දම්වැල් මැස්ම
- නැටි මැස්ම
- කතිර මැස්ම
- ලේසි ඩේසි මැස්ම
- බ්ලැන්කට් මැස්ම
- බූලියන් මැස්ම
- ප්‍රංශ ගැට මැස්ම
- හුරුලු කටු මැස්ම
- සැටින් මැස්ම

4




| | |
|---|---|
| 1 | - හුරුලු කටු මැස්ම |
| 2 | - නැටි මැස්ම |

5




6

- වාටි මැස්ම
- සැඟි වාටි මැස්ම
- සන්නාලි වාටි මැස්ම
- බ්ලැන්කට් මැස්ම

7 A - යහපත් වැඩ පුරුදු

- මැසීමට පෙර අත සේදීම.
- මැසීමෙන් පසු ස්ථානය යථාවත් කිරීම.
- මැසීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා මෙවලම් ගොනු කර තබා ගැනීම.

B - ආරක්ෂක පූර්වෝපා.

- ඉඳිකටු ,කතුරු වැනි තියුණු උපකරණ හුවමාරුවේදී ,ආරක්ෂාකාරී පියවර අනුගමනය කිරීම.
- කතුරු වල තුඩ කොටස ආවරණය කර තැබීම.
- ඉඳිකටු අල්පෙනෙති කුඩා කොට්ටයක රඳවා තැබීම.

8

- රෙද්ද පැය කිහිපයක් ජලයේ පොඟවා ,කැඳ සෝදා හැර, රෙද්දේ ඇති වැඩි ජලය ගසා, වැලක එල්ලා වේලා ඉස්ත්‍රික්ක කිරීම.
- රැළි වී හෝ පොඩි වී ඇත්නම් රෙද්ද ස්ත්‍රික්ක කිරීම .
- රෙද්දේ ඇද හැරීමට,විකර්ණය ඔස්සේ දෙකෙළවර අදිමින්, ඇදය ඉවත් කර ස්ත්‍රික්ක කිරීම.
- රෙද්ද හොඳින් ස්ත්‍රික්ක කර හරස් නූලක් ඉවත් කර ඒ ඔස්සේ කැපීම.

9 අක් සැරසිලි යනු ගෘහ පිළිවල හා ඇඳුම්වල අද්දර අලංකාර කර ගැනීම සඳහා යොදනු ලබන විවිධ ක්‍රම වේ.

10

  

සුදුසු මෝස්තර දෙකක් අඳින්න.